GET UP
START UP
FOR A WEALTHY NATION



# Empowering Youth Entrepreneurs

# සිසු පරපුර කර්මාන්ත ව්‍යවසායකත්ව සඳහා සවිබල ගැන්වීම

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය අනෙකුත් ආසියාතික රටවලට සාපේක්ෂව බොහෝ මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කරයි. අප මෙතෙක් උත්සාහ කර ඇත්තේ කෘෂිකර්මාන්තය තුළින් ඉතා වේගවත් ආර්ථික වර්ධනයක් ලඟා කර ගැනීමටයි. නමුත් නිදහසින් පසු වසර 75 ක් පුරා අපගේ ආර්ථික වර්ධනය සැලකිය යුතු මට්ටමකට ලඟා කර ගැනීමට අපොහොසත් වී ඇත. එසේ නම් ඉතිහාසයේ අප හට කොතැනක හෝ තීරණ ගැනීමේදී වැරැද්දක් සිදු වී ඇති බව වැටහී යයි. ලොව සෑම දියුණු රටක්ම පාහේ ඔවුන්ගේ දියුණුව ලඟා කරගෙන ඇත්තේ තම රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය මූලික කරගෙනයි. අප ද සිදු කල යුතුව ඇත්තේ අපගේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට වැඩි ප්‍රමුඛත්වයක් ලබා දී එය නඟා සිටුවීමයි. ඒ සඳහා ව්‍යවසායකත්ව සංස්කෘතියක් හා ව්‍යවසායකත්ව මානසිකත්වයක් රට තුළ උද්දීපනය කිරීම මේ වන විට කාලීන අවශ්‍යතාවයක් වී ඇත. 2030 වර්ෂය වන විට දැනට දළ ජාතික නිෂ්පාදනයට 15% ක් වන නිෂ්පාදන කර්මාන්ත දායකත්වය 25% ක් දක්වාත් දැනට 2.8% වන ව්‍යවසායකයින්ගේ ප්‍රතිශතය 10% දක්වාත් අවම වශයෙන් ඉහළ දැමීමට කටයුතු කල යුතු වේ. මෙවන් පසුබිමක් තුළ පුද්ගලයන් වැඩි වශයෙන් ව්‍යවසායකත්වය කරා යොමු කරවා ගැනීම සිදු කල යුතුය.



**මෙය සිදු කල හැකි එක් පාර්ශවකරුවකු වන්නේ පාසැලයි. පාසැල තුළින් අනාගතයේ දී අභියෝග ජයගත හැකි නිර්මාණශීලී දරුවකු සමාජගත කිරීම ගුරුවරයෙකුගේ වගකීමයි. එම දරුවා ව්‍යවසායකත්වය පෙරදැරි කරගත් දරුවකු වීම තුළින් අනාගතයේ දී ඔහු විශ්වය ජයගත හැකි ඉලක්ක හඹා යන රැකියා බිහිකරන විජයග්‍රාහී ව්‍යවසායකයකු වනු ඇත.**

## 2. ව්‍යාපෘතියේ අරමුණු



1. ජාතික නිෂ්පාදනයට ක්‍රියාශීලි හා ඵලදායි ලෙස දායක විය හැකි ව්‍යවසායකත්වය පෙරදැරි කරගත් සිසු පරපුරක් සමාජ ගත කිරීමට පාසැල් යොමු කිරීම.

2. කර්මාන්ත බිහිකිරීමට හා නව උත්පාදන සඳහා අවශ්‍ය වන්නා වූ ව්‍යවසායකත්ව සංස්කෘතියක් හා මානසිකත්වයක් රට තුළ ගොඩ නැගීම.

3. රැකියා අපේක්ෂාවෙන් අධ්‍යාපනය හදාරන්නකු නොව රටේ පවතින ගැටලුවලට විසඳුම් ලබාදෙන රැකියා නිර්මාණය කරන්නකු පාසැල් තුළින් සමාජයට එක් කිරීම.

4. සමාජයේ කවර හෝ පුද්ගල භූමිකාවක සාර්ථක ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා දීම සඳහා ව්‍යවසායකත්ව නිපුණතා අත්පත් කරදීම.

5. අභියෝග හමුවේ එයට ප්‍රතිචාර දක්වමින් එය තමාගේ වාණිජමය අවස්ථාවක් බවට පත් කර ගත හැකි දෙපයින් නැගී සිටින ශ්‍රී ලාංකිකයෙකු බිහි කිරීම.

## 3. ව්‍යවසායකත්ව නියමුවන්

රටේ කර්මාන්ත අංශය දියුණු කිරීම තුළින් රට සංවර්ධනය කිරීම කල හැකි බවට විශ්වාසයෙන් යුතුව කටයුතු කරන, අවදානම් දැරීමට නොපැකිලෙන, භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සම්පත් මනාව හැසිරවීමට රුචිකත්වයක් දක්වන, ඒ සඳහා කැපවන කණ්ඩායම ව්‍යයසායක නියමුවන් වේ.

ඒ අනුව ව්‍යවසායක නියමුවන් හැම විටම තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමටත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමටත

නව්‍ය උත්පාදන රටට හඳුන්වා දීමටත්, ඒ තුළින් රටේ ආර්ථික කටයුතුවලට දායක වීමටත් අපේක්ෂා කරයි. අප ජීවත් වන පරිසරය තුළින්ම අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සඳහා ගැලපෙන ආකාරයට සම්පත් මෙහෙයවීම නියමුවන් විසින් සිදු කරයි.

රටක ආර්ථික වර්ධනය උදෙසා ව්‍යවසායක නියමුවන් පාසැල් තුලින්ම හඳුනාගෙන ඔවුන්ව දිරිමත් කරමින් අනාගත දක්ෂ ව්‍යවසායකයන් බවට පත් කිරීමට අවශ්‍ය වන්නා වූ අඩිතාලම පාසලේදී ම ලබාදීමට කාලය එළඹ ඇත.



## 4. කර්මාන්ත ව්‍යවසායකත්ව කව

හඳුනාගන්නා ව්‍යවසායක නියමුවන්ගේ එකතුවක් ව්‍යවසායක කවයක් වේ. කවයක් ලෙස ව්‍යවසායක නියමුවන් එකතු වී කටයුතු කිරීමෙන් ඔවුනොවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීම ප්‍රශ්නවලට සාමූහිකව විසඳුම් සෙවීම ව්‍යවසායකත්ව පෞරුෂය ගොඩනැගීම සඳහා ශක්තිමත් පවුරක් ලෙස කටයුතු කිරීමේ හැකියාව ඇති වේ.

### 4.1 කවයේ නාමය

කර්මාන්ත ව්‍යවසායකත්ව කව

GET START UP
FOR A WEALTHY NATION



## 4.2 කවයක සාමාජිකත්වය ලබාගැනීම

9 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ඕනෑම විෂය ධාරාවක් හදාරන සිසු සිසුවියන් හට කවයකට සම්බන්ධ විය හැකිය. කවයක සිටිය යුතු අවම සාමාජික සංඛ්‍යාව 15 වන අතර, උපරිම සිසුන් සංඛ්‍යාව 25කි.

මෙයට වඩා සිසු සංඛ්‍යාවක් කවයට ඉදිරිපත් වන්නේ නම් විදුහල්පතිතුමාගේ අවසරය මත තවත් කවයක් ඇති කර ගත හැකිය. ඒ ඒ කවයට තේමාවක් ඇති කර ගැනීමෙන් ව්‍යවසායක කවයක් වඩාත් වර්ණවත් වේ.

උදා :- 1
2

## 4.3 කවයක ක්‍රියාකාරීත්වය

මෙම ව්‍යවසායක කවයක් ව්‍යාපාරික ආයතනයක් ලෙස පවත්වා ගෙනයාමෙන් කවයේ සියලුම සාමාජිකයන් හට ව්‍යාපාරික අත්දැකීම් පාසැල තුළින්ම ලබා ගැනීමට අවස්ථා සැලසේ. එනම් ව්‍යාපාරික ආයතනයක් ලෙස පවත්වා ගෙනයාමෙන් ව්‍යාපාරික ආයතනයක සිදුවන සියලු කටයුතු ද ඔවුන් විසින් සිදු කල යුතු වේ.

නව නිෂ්පාදන හෝ සේවා කටයුතු සිදුකිරීම, අලෙවි කටයුතු සිදුකිරීම, ඒවාට අදාල ලාභ අලාභ ගණනය කිරීම වැනි දෑ සිදු කිරීමෙන් සාමාජිකයන් තුල ව්‍යවසායකත්වය සඳහා උනන්දුවක් ඇතිකල හැකිය.

මාසිකව කණ්ඩායම් රැස්වීම් පවත්වා පසුගිය මාසය තුළ කල ක්‍රියාකාරකම් හා ඒවායේ අඩුපාඩු සාකච්ඡා කිරීම මෙන්ම ඉදිරි මාසයේ දී සිදු කිරීමට අපේක්ෂා කරන කාර්යයන් හා එය සිදු කෙරෙන ආකාරය සැලසුම් සකස් කිරීම, කාර්යයන් බෙදා ගැනීම වැනි දෑ සාකච්ඡා කළ යුතුය. එසේම සතියකට එක් දිනක් පාසැල ආරම්භ කිරීමට පෙර පැය 1 1/2 ක් හෝ පාසැල නිමවීමෙන් පසු පැය 1 1/2 ක් වැනි කාලයක් යොදා ගනිමින් කවයේ කටයුතු හා ගැටළු සාකච්ඡා කර ගත යුතුය.

## 4.4 කවයක නිලධාරි මණ්ඩලය

| | |
|---|---|
| 1. ප්‍රධාන විධායක නිලධාරි | - කණ්ඩායමේ ප්‍රධානියා වේ. බාහිර ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු හා මෙහෙයවීම් මොහු විසින් සිදු කල යුතුය. |
| 2. ගණකාධිකාරී | - කවයේ ගිණුම් කටයුතු සහ වාර්තා තබා ගැනීම ගණකාධිකාරීන් ගේ කාර්යය වේ. |
| 3. අලෙවි සම්බන්ධ නිලධාරි | - කවය විසින් සිදුකරන නිෂ්පාදන හෝ සේවාවල ප්‍රචාරණය, අලෙවිය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| 4. නිෂ්පාදනය සම්බන්ධ නිලධාරි | - කවය විසින් සිදු කරන ලබන නිෂ්පාදන කාර්යයන් හෝ සේවාවන් හි කටයුතු ගුණාත්මකව පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වේ. |

සෙසු සාමාජිකයින් මෙම 2,3,4, නිලධාරී මණ්ඩලයේ යටතේ කවයේ රාජකාරී බෙදා ගනිමින් කවය තීරණය කරනු ලබන ක්‍රියාකාරකම් ඉටු කල යුතුය.

## 5. ව්‍යාවසායකත්ව නියමුවන්ගේ ආචාර ධර්ම පද්ධතිය



* සත්‍ය තොරතුරු පමණක් සන්නිවේදනය කිරීම.
* අන් අයට හානි නොකිරීම / ගරු කිරීම.
* සාධාරණව හා අවංකව කටයුතු කිරීම.
* නිෂ්පාදනයේ / සේවාවේ නියමිත ප්‍රමිතිය ගැන සැලකිලිමත් වීම.
* පරිසර දූෂණය අවම කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම.
* නියමිත ක්‍රමවේදයන්ට අනුව අපද්‍රව්‍ය බැහැර කිරීම.
* පාසැලේ කීර්තිනාමය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම.

GET START UP
FOR A WEALTHY NATION

# 6. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය



- ★ අධ්‍යාපන අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය ඒකාබද්ධව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ★ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පාසැල් හඳුනා ගැනීම.
- ★ හඳුනාගත් පාසැල්වල ගුරුවරුන් ප්‍රථමයෙන් මෙම නියමු වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම.
- ★ එම ගුරුවරුන් විසින් පාසැල් තුල ව්‍යවසායකත්ව කව පිහිටුවීම.
- ★ සිසුන්ගේ සැඟවී ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ මතු කර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම.
- ★ ක්‍රියාකාරකම් මූලික කර ගනිමින් නිල ලාංඡන ලබාදීම (ව්‍යවසායකත්ව නියමු, ලෝකඩ, රජත, ස්වර්ණ සහ ජනාධිපති)
- ★ සෑම නියමුවෙක් ම සටහන් පොතක් සකස් කිරීම - මෙහි තමා නියැලෙන ක්‍රියාකාරකම් හා ව්‍යවසායකත්වය පිළිබඳ එකතු කර ගන්නා තොරතුරු ඇතුලත් කළ යුතුය.





*අභියෝග ජයගත හැකි නිර්මාණශීලී දරුවකු බිහිකරමු.*

## 6.1 ව්‍යවසායකත්ව නියමුවෝ ලාංඡන ලබා ගත යුතු ආකාරය

| | |
|---|---|
| 1. ව්‍යවසායකත්ව නියමු ලාංඡනය - | ආරම්භක සෑම සාමාජිකයකුට ම නියමු ලාංඡනය ලබාදේ. ඒ සඳහා නම්කර ඇති කණ්ඩායම් සාමූහික ක්‍රියාකාරකම් ඉටු කිරීමට දායකත්වය ලබාදිය යුතුය. |
| 2. ලෝකඩ ලාංඡනය - | මේ සඳහා නම් කර ඇති ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකර ඒ බවට ගුරුවරයා විසින් සහතික කල යුතු අතර, ඊට අමතරව කා.ස. මණ්ඩලයේ ව්‍යාපෘතිය බාර නිලධාරීවරයා විසින් ද සහතික කළ යුතුය. |
| 3. රජත ලාංඡනය - | මේ සඳහා නියමිත ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකර ඒ බවට ගුරුවරයා හා පාසැලේ විදුහල්පතිවරයා හා අධ්‍යාපන කලාප කාර්යාලයෙන් සහතික කල යුතුය. එයට අමතරව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපෘතිය භාර නිලධාරිවරයා, දිස්ත්‍රික්/පළාත් අධ්‍යක්ෂකවරයන් සහතික කල යුතුය. |
| 4. ස්වර්ණ පදක්කම - | මේ සඳහා නියමිත ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකර ඒ බවට ගුරුවරයා, විදුහල්පතිවරයා, කොට්ඨාශ හා කලාප කාර්යාලයේ අධ්‍යක්ෂකවරයා හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂවරයා සහතික කළ යුතු අතර, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපෘති භාර නිලධාරීවරයා දිස්ත්‍රික්/පළාත් අධ්‍යක්ෂකවරයා හා ව්‍යාවසායකත්ව සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා සහතික කල යුතුය. එමෙන්ම යම් අයකුට ස්වර්ණ පදක්කම් ලබා ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනයේ වාණිජ අංශයේ අධ්‍යක්ෂකවරයා විසින් ශිෂ්‍යයා මෙම පදක්කමට සුදුසු බවට සහතික කළ යුතුය. |

**5. ජනාධිපති පදක්කම ලබා ගැනීම -** ඒ සඳහා වන නියමිත ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකර ඒ බවට ගුරුවරයා, විදුහල්පතිවරයා, කොට්ඨාශ / කලාප අධ්‍යක්ෂකවරයා, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරයා හා අධ්‍යාපන ලේකම් විසින් සහතික කළ යුතු අතර, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපෘති භාර නිලධාරීවරයා දිස්ත්‍රික් / පළාත් අධ්‍යක්ෂකවරයා, ව්‍යාවසායකත්ව සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා, මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල්වරයා, සභාපතිතුමා හා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සහතික කළ යුතුය. එමෙන්ම ජාතික අධ්‍යාපන ආයතනයේ වාණිජ අංශයේ අධ්‍යක්ෂකවරයා හා එම ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහතික කළ යුතුයි.




## 6.2 සටහන් පොත

- ☆ ව්‍යාවසායකත්ව නියමුවා ව්‍යවසායකත්ව කවයේ සිදු කරන ක්‍රියාකාරකම් හා උනන්දුව මත සටහන් පොත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කෙරේ. ඒ සඳහා කවය භාර ගුරුවරයාගේ නිර්දේශය අවශ්‍ය වේ.
- ☆ එම සටහන් පොතේ නියමුවාගේ පාසැල් නිල ඇඳුම සහිත ඡායාරූපයක් ඇලවිය යුතුය.
- ☆ නියමුවා විසින් සිදු කරන සෑම ක්‍රියාකාරකමක් ම, විශේෂ වැඩසටහන්වලට සහභාගී වීම යන ආදී සෑම ක්‍රියාවක්ම පොතෙහි ඇතුලත් විය යුතු අතර එය අධීක්ෂණ නිලධාරියා විසින් අත්සන් කර තිබිය යුතුය.
- ☆ එක් වැඩසටහනක් එක් පිටුවක් පමණක් භාවිත කල යුතුය.
- ☆ සටහන් පොත පිරිසිදුව හා අලංකාරව තබා ගැනීම වැදගත් වන අතර, එය ආරක්ෂා කර ගත යුතුය. (එක් නියමුවෙකු ලබා දෙන්නේ එක් සටහන් පොතක් පමණි.)
- ☆ සටහන් පොතට පොලිතින් කවර නොදැමිය යුතුය.

# 7. ව්‍යවසායකත්ව නියමු වැඩසටහන් මෙහෙයවන ජාලය

## 7.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය



- වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ගුරුවරුන් තේරීම (ගුරුවරයාගේ අවබෝධය, ක්‍රියාශීලීත්වය, පෞර්ෂත්වය, උනන්දුව) පදනම්කොට විදුහල්පති විසින් තෝරා ගත යුතුය.
- ව්‍යවසායකත්ව කවය මිශ්‍ර පාසලක ක්‍රියාත්මක වන්නේ නම් පිරිමි ගුරුවරයෙකු හා කාන්තා ගුරුවරියක බැගින් දෙදෙනෙකු තෝරා ගත යුතුය.
- ගුරුවරයා වෙනත් පාසැලකට ස්ථාන මාරුවීමක් සඳහා නම් කර ඇති විට වෙනත් ගුරුවරයෙකු විදුහල්පති විසින් ඒ සඳහා පත් කිරීම.
- ව්‍යවසායකත්ව කවය හැම විටම විදුහල්පති කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක හා ප ළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අධීක්ෂණයට යටත් වේ.
- නිල ලාංඡන සඳහා සුදුසු නියමුවන් තෝරා ගැනීමට සහාය වීම.








## 7.2 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යභාරය

- ✍ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීම.
- ✍ තෝරාගත් "ව්‍යවසායකත්ව කවය" දැනුවත් කිරීමට සහාය වීම.
- ✍ කවයේ ක්‍රියාකාරකම් සඳහා (උදා :- අලෙවි පොළවල්, තරඟ, නව නිර්මාණ) ගුරුවරයාට සහාය වීම.
- ✍ කවය යම් නිෂ්පාදන කටයුත්තක් කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම, කළමණාකරණ දැනුම ලබාදීම.
- ✍ ලාංඡන සඳහා වන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- ✍ ශිෂ්‍ය සටහන් පොත් අධීක්ෂණය කිරීම.
- ✍ බාහිර ව්‍යාපාරික ආයතන සම්බන්ධ කරමින් කවයේ සාමාජිකයින්ගේ ව්‍යාවසායක මානසිකත්වය ගොඩ නැඟීමට සහාය වීම.








# සටහන්

## ව්‍යවසායකත්ව නියමු පදක්කම සඳහා ක්‍රියාකාරකම්



### සාමූහික ක්‍රියාකාරකම්

1. හරිත පරිසරයක් නිර්මාණය කිරීම.
   උදා:- අපද්‍රව්‍ය කළමනාකරණය - භාවිතයට ගත නොහැකි අපද්‍රව්‍ය එකතු කර විකුණා ආදායමක් උත්පාදනය කිරීම. එම ආදායම කවයේ අවශ්‍යතා සඳහා යොදා ගැනීම. (කඩදාසි / කාඩ්බෝඩ් / ඉවතලන පුවත්පත්)

2. දැනුම මිනුම තරඟ පැවැත්වීම. (ව්‍යවසායකත්වය තේමාව කරගත්)

3. ප්‍රජා ව්‍යාපෘති සංවිධානය කිරීම (මල් දන්සැල්)

4. ප්‍රදේශයේ කර්මාන්ත නැරඹීම සංවිධානය කිරීම හා එයට සහභාගී වීම.

5. වෙනත් සුදුසු සාමූහික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

මෙම ක්‍රියාකාරකම් අතුරින් අවම වශයෙන් ක්‍රියාකාරකම් 03 කට වත් නියමුවන් සහභාගී වී තිබේ නම් ඔහුට / ඇයට ව්‍යවසායකත්ව නියමු පදක්කම හිමි වේ.

# ලෝකඩ පදක්කම සඳහා වන ක්‍රියාකාරකම්



## සාමූහික ක්‍රියාකාරකම්

1. හරිත පරිසරයක් නිර්මාණය කිරීම.
   උදා:- අපද්‍රව්‍ය කළමනාකරණය - ඉවතලන ප්ලාස්ටික් / පොලිතින් වැනි ද්‍රව්‍ය පරිසරයට මුදා නොහැර ඒවා පාසැලේ එක් ස්ථානයක රැස්කර විකිණීමෙන් මුදල් ලබා ගැනීම. එම මුදල් කවයේ දියුණුවට යොදාගත හැක.

2. රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම.

3. පාසැලේ වගා බිමක් ඇති කිරීම. ඉන් ලබන ආදායම ව්‍යවසායකත්ව කවයට යොදා ගැනීම.

4. ව්‍යවසායකත්ව දේශන සංවිධානය කිරීම.

5. ප්‍රජා ව්‍යාපෘති සංවිධානය කිරීම.

6. ව්‍යවසායකත්ව සතියක් සංවිධානය කිරීම.

7. වෙනත් සුදුසු ව්‍යාපෘති සංවිධානය කිරීම.

# තනි පුද්ගල ක්‍රියාකාරකම්

1. උදෑසන රැස්වීමේ දී දේශන පැවැත්වීම.
   (ව්‍යවසායකත්වයට අදාළව)

2. ව්‍යවසායකත්වය පිළිබඳ ගද්‍ය සංග්‍රහයක් කිරීම.
   (චරිතාපදාන / ව්‍යවසායකත්වයට අදාළ වූ වෙනත්)

3. දැනුම මිනුම තරඟ සඳහා සහභාගීත්වය

4. ශ්‍රම දායකත්වය - පාසැලේ සිදුවන වියදම් අවම කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ක්‍රියාකාරකම් (උදා:- ලී පුටු / මේස අලුත්වැඩියාව)

5. වෙනත් සුදුසු ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

ඉහත ක්‍රියාකාරකම් අතුරින් අවම වශයෙන් සාමූහික ක්‍රියාකාරකම් තුළින් ක්‍රියාකාරකම් 03 ක් හා පුද්ගල ක්‍රියාකාරකම් තුළින් ක්‍රියාකාරකම් 03ක් වත් ඉටුකර තිබීමෙන් ලෝකඩ පදක්කමට හිමිකම් කියනු ලබයි.



GET START UP
FOR A WEALTHY NATION

# රජත පදක්කම සඳහා වූ ක්‍රියාකාරකම්



## සාමූහික ක්‍රියාකාරකම්

1. පෝස්ටර් තරඟ සංවිධානය කිරීම. (ව්‍යවසායකත්වයට අදාල වූ)
2. කථික තරඟ පැවැත්වීම. (සංවිධානය කිරීම)
3. ව්‍යවසායකත්ව සතියක් සංවිධානය කිරීම.
4. පාසැලේ සාමූහික අලෙවිසැලක් පවත්වාගෙන යාම. (උදා:- Book Shop)
5. කර්මාන්ත අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.

## තනි පුද්ගල ක්‍රියාකාරකම්

1. සුදුසු ව්‍යාපෘතියක් හඳුනාගෙන ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම.
2. ව්‍යවසායකත්වය පිළිබඳ කථික තරඟවලට සහභාගීවීම.
3. ව්‍යවසායකත්ව පිළිබඳ දේශන ලබාදීම.
4. Creating a Facebook Business Page
5. Create a Presentation
6. Attractive F.B. Post on the Page

ඉහත ක්‍රියාකාරකම් අතුරින් අවම වශයෙන් සාමූහික ක්‍රියාකාරකම් 03 ක් හා පුද්ගලික ක්‍රියාකාරකම් අතුරින් ක්‍රියාකාරකම් 03 ක් වත් ඉටුකර තිබීමෙන් රජත පදක්කමට හිමිකම් කියනු ලබයි.

# ස්වර්ණ පදක්කම සඳහා වූ ක්‍රියාකාරකම්



## සාමූහික ක්‍රියාකාරකම්

1. කවය තුළින් පාසැල තුළ අලෙවිසැලක් පවත්වාගෙන යාම. (Canteen / Book Shop)
2. තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
3. ව්‍යවසායකත්වය පිළිබඳ බාහිර ආයතන සම්බන්ධ කරගනිමින් වැඩමුළු සංවිධානය කිරීම.
4. Digital Platform නිර්මාණය කිරීම.

## තනි පුද්ගල ක්‍රියාකාරකම්

1. සුදුසු ව්‍යාපෘති යෝජනාවක් ක්‍රියාවට නැංවීම.
2. Web page නිර්මාණය කිරීම.
3. Creating Youtube Channel
4. විවිධ නිෂ්පාදන සඳහා ඇසුරුම් නිර්මාණය (Design) කිරීම.
5. නිෂ්පාදන කර්මාන්තයක මාස 02 ක් පමණ කාලයක් රැඳී සිටිමින් එය අධ්‍යයනය කර එම කර්මාන්තය දියුණු කළ හැකි ආකාරය පිළිබඳව යෝජනාවලියක් සකස් කිරීම. (Inplant Study)
6. වෙනත් සුදුසු ක්‍රියාකාරකම්.

ස්වර්ණ පදක්කම සඳහා ඉහත සාමූහික ක්‍රියාකාරකම්වලින් 03 ක් හා පුද්ගල ක්‍රියාකාරකම් 04 ක් වත් සිදු කිරීමෙන් ස්වර්ණ පදක්කම සඳහා හිමිකම් කියනු ලබයි.

GET UP START

FOR A WEALTHY NATION

# ජනාධිපති පදක්කම සඳහා වූ ක්‍රියාකාරකම්



## සාමුහික ක්‍රියාකාරකම්

1. කර්මාන්ත අවශ්‍යතා සඳහා යන්ත්‍ර නිර්මාණය කිරීම.
2. දිස්ත්‍රික්කයේ කර්මාන්ත සංවර්ධනය සඳහා දායකවන්නා වූ ආයතන සියල්ලම ගෙන්වා වැඩමුළුවක් පැවැත්වීම.
3. පාසැලට අවශ්‍ය වන්නා වූ ඇතැම් ද්‍රව්‍ය කවය තුළින්ම නිෂ්පාදනය කිරීම.
   උදා:- කඩදාසි / සබන් / කොසු / ඉදල්
4. බාහිර පාසැල් තුළ ව්‍යවසායකත්ව කව ආරම්භ කිරීම සඳහා කවය විසින් වැඩමුළු සංවිධානය කිරීම.

## පුද්ගලික ක්‍රියාකාරකම්

1. කර්මාන්ත අවශ්‍යතා සඳහා යන්ත්‍ර නිර්මාණය කිරීම.
2. සුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම හා එහි කටයුතු ක්‍රමානුකූලව (ගිණුම් තැබීම / අලෙවිය / නිෂ්පාදනය) පවත්වාගෙන යාම.
3. Uploading your first video to your Youtube Channel
4. Setting up your Business at Google “My Business Place”
5. Create New “Apps”
6. ව්‍යවසායකත්වය හා ඊට අදාළ වූ මාතෘකා පිළිබඳ වැඩමුළු සංවිධානය හා දේශන ලබාදීම.
7. තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ජනාධිපති පදක්කම ලබා ගැනීම සඳහා අවම වශයෙන් සාමුහික ක්‍රියාකාරකම් 03 ක් හා පුද්ගල ක්‍රියාකාරකම් 04 ක් වත් සම්පූර්ණ කර තිබිය යුතුය.



අභියෝග ජයගත හැකි නිර්මාණශීලී දරුවකු බිහිකරමු.